සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 15 S I,II

නම: ...........................................

# ක්‍රිස්තියානි ධර්මය I

කාලය පැය තුනයි

01. "එතුමාණෝ යුක්තියෙන්ද ධර්මිෂ්ඨකමින් ද රජකම් කරන සේක" මෙලෙස දිවැස් වැකි ප්‍රකාශ කළේ,
1. යෙසායා දිවැසිවරයා ය. 2. මීකා දිවැසිවරයා ය. 3. මලාකි දිවැසිවරයා ය. 4. ආමෝස් දිවැසිවරයා ය.

02. ස්නාවක ජොහන්තුමා ජේසුස් වහන්සේ තම අනුගාමිකයන්ට හඳුන්වා දෙනු ලැබුයේ,
1. දුක් විඳින සේවකයාණන් ලෙසය.
2. වනාන්තරයේ සමිඳුන් හට මාවතක් එළිකරන්නා ලෙසය.
3. ලෝකයේ පව් දුරු කරන දෙවියන්ගේ බැටළු පෝතකයාණන් ලෙසය.
4. යහපත් බැටළු එඬේරාණන් ලෙසය.

03. මිනිසා පාපයෙන් මුදවාගෙන බිඳී ගිය දේව සබඳතාවය නැවත ශක්තිමත් කරනු ලැබුයේ,
1. මෝසෙස් ය. 2. ස්නාවක ජොහාන් ය. 3. ආබ්‍රහම් ය. 4. ජේසුස් වහන්සේය.

04. ව්‍යවස්ථාව තමන්ගේ වාසියට අර්ථකතනය කරමින් ආගමික වශයෙන් ජනතාව දැඩි පීඩනයකට ලක් කරනු ලැබුයේ,
1. පරිසිවරුන් හා සමාරිතවරුන් ය. 2. පරිසිවරුන් හා සද්දුසිවරුන් ය.
3. සද්දුසිවරුන් හා සමාරිතවරුන්ය. 4. සමාරිතවරුන් හා ලියන්නන්ය.

05. ශ්‍රී ලාංකේය ජන සමාජයේ ජාතික සිරිත් ඉටු කිරීමේ දී කිතුණු අප ක්‍රියා කළ යුතු වන්නේ,
1. නැකැත්වලට මුල්තැනක් දීමෙන් ය.
2.කිතුණු ඇදහිල්ලට ශුද්ධ බයිබලීය පදනමට මුල්තැන දෙමින්ය.
3. චාරිත්‍ර ඉටු කිරීමට උනන්දු වීමෙන් ය.
4. සිංහල චාරිත්‍ර පිළිබඳ සැළකිලිමත් වීමෙන් ය.

06. මරණයට පෙර මෙසියස් වහන්සේ දකින බව අනාවරණය කරනු ලැබුයේ,
1. ස්තෙපන්ය 2. පාවුල්තුමාය 3. සිමියොන් ය. 4. පිලිප් ය.

07. "නියමිත පමණට වැඩියෙන් අයබදු අය නොකරන ලෙස ස්නාවක ජොහාන්තුමා අනුශාසනා කරනු ලැබුයේ,
1. පොදු ජනතාවටය 2. ආරක්ෂක අංශයටය
3. ජුදා ආගමික ජනතාවටය 4. අයකැමියන් හටය.

08. බදු අය කිරීමේ දී ජනතාවට එල්ල කළ පීඩනය නිසා ජුදා ජනතාව එම නිළධාරීන් සලකනු ලැබුයේ,
1. දුෂ්ඨ පාලකයින් ලෙසය. 2. දේශ ද්‍රෝහීන් හා පව්කරුවන් ලෙසය.
3. තම සතුරන් ලෙසය. 4. තම විරුද්ධවාදීන් ලෙසය.

09. ජේසුස් වහන්සේ දේව අපහාස කරන්නෙකු ලෙස සලකා පරිසිවරු උන්වහන්සේට වරද තබන්නට උත්සහ කළේ,
1. අංශභාග රෝගියා සුව කිරීමේදී ය. 2. දියඋදර රෝගියා සුව කිරීමේ දීය.
3. අන්ධ මිනිසා සුව කිරීමේදී ය. 4. අතක් පණ නැති මිනිසා සුව කිරීමේ දීය.

10. මරණින් මතු ජීවිතයක් ගැන විශ්වාසයෙන් බැහැර වූ පිරිසක් වන්නේ,
1. පරිසිවරුන් ය. 2. සද්දුසිවරුන් ය. 3. අයකැමියන් ය. 4. සමාරිතයන් ය.

11. දේවරාජ්‍යයේ පදනම සාමය බව පෙන්වීමට ජේසුස් වහන්සේ සිදුකළ සංකේතාත්මක ක්‍රියාව වන්නේ,
1. කොටළුවෙකු පිට නැගී ජෙරුසෙලමට යෑමයි. 2. නායක පූජකවරුන් සමඟ සාමයෙන් සිටීමයි.
3. පරිසිවරුන්ට විරුද්ධව ක්‍රියා නොකිරීමයි. 4. සාම පණිවිඩය ප්‍රකාශ කිරීමයි.

12. ජේසුස් වහන්සේගේ දහඩිය බිංදු ලේ බිංදු මෙන් බිමට වැටුණේ,
1. පාළුකරයේ යාච්ඤා කරමින් සිටින අවස්ථාවේ දීය.
2. ශ්‍රාවකයින් කැඳවීමට යාච්ඤා කරන අවස්ථාවේ දීය.
3. යායිරස්ගේ නිවසේ යාච්ඤා කරමින් සිටින අවස්ථාවේ දීය.
4. ඔලිව කන්දේ යාච්ඤා කරමින් සිටින අවස්ථාවේ දීය.

13. ජුදා සමාජයේ පිළිගැනීමට අනුව යමෙකුට දුක් විඳීමට සිදුවන්නේ,
1. පෙර ආත්මයේ කර ඇති පව් නිසාය.
2. දේව කැමැත්තට විරුද්ධව ක්‍රියා කිරීම නිසාය.
3. දෙමව්පියෝ කර ඇති පව් නිසාය.
4. තමා විසින් කර ඇති පව් නිසාය.

14. ජේසුස් වහන්සේට මරණීය දඬුවම ලබාදීමට පිලාත් ආණ්ඩුකාරයා වෙත යවනු ලැබුයේ,
1. උන්වහන්සේ ගලීලයෙකු වූ නිසාය.
2. උන් වහන්සේ ජුදෙව්වන්ගේ රජ යැයි කියාගත් නිසාය.
3. මරණීය දඬුවම දීමේ බලය ජුදා ශ්‍රේෂ්ඨාධිකරණයට නොමැති නිසාය.
4. උත්තම පූජකයා මරණීය දඬුවම නියම කිරීමට අකමැති වූ නිසාය.

15. එම්මාවුස් ගමට ගිය ශ්‍රාවකයින් ජීවමාන ජේසුස් වහන්සේ හඳුනාගනු ලැබුයේ,
1. හමු වූ පළමු අවස්ථාවේදීම ය.
2. රොටී ගෙන ආශිර්වාද පැවසීමේ දීය.
3. නවාතැන් ගැනීමට සූදානම් වන විටය.
4. නවාතැනින් පිටත් වීමේදී ය.

16. ස්නාවක ජොහාන්තුමාට අනුව ජේසුස් වහන්සේ ජනතාව බෞතීස්ම කරනු ලබන්නේ,
1. ශුද්ධාත්මයාණන්ගෙන් හා ගින්නෙන් ය.
2. ශුද්ධාත්මයාණන්ගෙන් හා ජලයෙන් ය.
3. ජලයෙන් හා සුළඟින් ය.
4. සුළඟින් හා ගින්නෙන් ය.

17. ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂාවන්ගෙන් නපුරේ බලයට කීකරු වීමේ අභියෝගයක් එල්ල වූයේ,
1. පළමු පරීක්ෂාවෙනි.
2. දෙවන පරීක්ෂාවෙනි.
3. තෙවන පරීක්ෂාවෙනි.
4. ඉහත සියල්ලෙහි.

18. රූප විපර්යාසය ජේසුස් වහන්සේගේ ජීවිතයෙන් ඉතා වැදගත් සිද්ධියක් ලෙස සළකනු ලබන්නේ,
1. සත්‍යතාවේ ආලෝකයාණන් අනාවරණය වූ නිසාය.
2. ක්‍රිස්තුස් වහන්සේගේ තේජශ්‍රීය බැබළුණු නිසාය.
3. ජේසුස් වහන්සේගේ රූපශ්‍රීයේ විපර්යාසයක් සිදු වූ නිසාය.
4. ජේසුස් වහන්සේ ව්‍යවස්ථාව සම්පූර්ණ කළ නිසාය.

19. ජේසුස් වහන්සේගේ දේශනා වල මූලික හරය වූයේ,
1. ප්‍රේමයයි
2. දේව රාජ්‍යයයි.
3. සමාව දීමයි.
4. සමානාත්මතාවයයි.

20. ජේසුස් වහන්සේ දේව රාජ්‍යයේ ලකුණු දක්වනු ලැබුයේ,
1. තම බලය පෙන්වීමේ අභිප්‍රාය පෙරදැරි කරගෙනය.
2. ආගමික කණ්ඩායම් අභියෝගයට ලක් කිරීමේ අභිප්‍රාය පෙරදැරි කරගෙනය.
3. කොන් කරනු ලැබූ ජනයාගේ තිබූ ප්‍රේම හා දයානුකම්පාව පෙරදැරි කරගෙනය.
4. දේව රාජ්‍යයේ අභිරහස්මය බව ප්‍රකාශ කිරීම පෙරදැරි කරගෙනය.

21. මහ මංගල භෝජනය පිළිබඳ උපමාව ජේසුස් වහන්සේ විසින් ප්‍රකාශයට පත් කරනු ලැබුයේ,
1. ප්‍රාතිහාර්යක් සිදුකළ අවස්ථාවේදී ය.
2. පරිසිවරයෙකුගේ නිවසේ දී භෝජන සංග්‍රහයකට සහභාගී වූ අවස්ථාවේ දීය.
3. දේව රාජ්‍යය ප්‍රකාශ කිරීමේ අවස්ථාවේ දීය.
4. මංගල භෝජනයක් පවත්වන අවස්ථාවේ දීය.

22. දේව රාජ්‍යය තුළ නායකත්වය දැරීමේ දී දේව රාජ්‍ය පුරවැසියන් සැම දෙනාම දැරිය යුත්තේ,
1. අන් අය යටත්කර ගැනීමේ නායකත්වයකි.
2. ශ්‍රාවකත්ව නායකත්වයකි.
3. සේවක නායකත්වයකි.
4. දේව රාජ්‍යයට කැප වූ නායකත්වයකි.

23. යහපත් බැටළු එඬේරා ලෙස හඳුන්වනු ලබන්නේ,
1. දෙවියන් වහන්සේය.
2. බැටළුවන් බලාගන්නා එඬේරාය
3. ජේසුස් වහන්සේය.
4. රට පාලනය කරන නායකයන්ය.

24. "පල්ලියේ ගොඩනැගිල්ල ජනතාව සඳහායි" යන උදාර ආකල්පයෙන් තම ලැගුම් ගෙය පවා පරිත්‍යාග කරනු ලැබුයේ,
1. ගරු තිස්සබාලසූරිය පියතුමාය.
2. ගරු චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමාය.
3. දෙවන ජුවාම් පාවුල් පාප් වහන්සේය.
4. ගරු පීටර් ජෙරාඩ් ද සිල්වා දේවගැතිතුමාය.

25. මුල් කිතුණු සභාවේ සුබ සාධන සේවය ඉදිරියට ගෙන යාමට නායකත්වය ලබාදෙනු ලැබුයේ,
1. ස්තේපන්ටය.
2. නිකනෝර්ටය.
3. පිලිප්ටය.
4. තිමෝතියස්ටය.

26. කිතුණුවෙකු වශයෙන් නිසිලෙස එළ දැරීමට අප ක්‍රියා කළ යුතු වන්නේ,
1. සැම ඉරිදාම නමස්කාරයට සහභාගී වීමයි.
2. සැම විටම සාක්ෂි දැරීමට සූදානම්ව සිටීමයි.
3. ජේසුස් වහන්සේට බද්ධව සිටීමයි.
4. ජේසුස් වහන්සේ පිළිබඳ ඉගැන්වීමයි.

27. වර්තමාන සමාජයේ ජීවත්වන කිතුණුවන් හට මුල් කිතුණු සභාවෙන් ගත හැකි ආදර්ශය නම්,
1. සෑමවිටම දේවස්ථානයේ නමස්කාර කිරීමයි.
2. සභාවේ අවශ්‍යතා සොයා බැලීමට වෙනම කණ්ඩායමක් තෝරාගැනීමයි.
3. විශේෂ දිනයන්වල දී පමණක් නමස්කාරයට සහභාගී වීමයි.
4. එකිනෙකාගේ අවශ්‍යතාවයන් සොයා බලා ඉටු කිරීමයි.

28. වර්තමානයේ ආර්ථික අර්බුදයකට මුහුණදෙන අප කිතුණුවන් ලෙස ක්‍රියා කළ යුතු වන්නේ,
1. පළමුව අපගේ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමයි.
2. ඉවසීමෙන් ප්‍රේමයෙන් යුතුව ක්‍රියා කිරීමයි.
3. හැකි සෑම විටම උද්ඝෝෂණ කිරීමයි.
4. අපගේ ආර්ථිකය ශක්තිමත් කරගැනීමයි.

29. කිතුණුවා නොඉවසිලිමත්ව තම ජීවිත මත රඳවා ඇති මහඟු බලාපොරොත්තුව වන්නේ,
1. ක්‍රිස්තුස් වහන්සේ ය.
2. කිතුණුවකු වීමය.
3. කිතුණු බෞතීස්මය ය.
4. ශුද්ධාත්ම ආලේපය ය.

30. පෙන්තකොස්ත අත්දැකීමෙන් ජීවිතයක් ලද කිතුණුවන් සිය අධ්‍යාත්මික වර්ධනය සඳහා කළ දෙයක් නොවන්නේ,
1. ගෙයින් ගෙට ගොස් රොටි කැඩීම.
2. සහභාගීකම පැවැත්වීම.
3. යාච්ඤාවේ නිරතව කල්ගත කිරීම.
4. තනි තනිව ශුභාරංචිය පැවසීම.

31. පාවුල්තුමා ජුදෙව් ආගමික වත් පිළිවෙත් හා නීති රීති පිළිපැදි බවට පෙන්වන සිදුවීමක් වන්නේ,
1. තම නම වෙස්කර භාවිතා කිරීමය.
2. බාර්ණබස්ගෙන් වෙන් වී සේවයේ යෙදීමය.
3. කෙන්ක්‍රෙයාවේ දී හිසමුඩු කිරීමය.
4. රෝම අධිරාජ්‍යයාගේ විනිශ්චය ඉල්ලීමයි.

32. පළමු ධර්මදූත ගමනේ දි පාවුල්තුමා සහ බර්ණබස්තුමා දෙවිවරුන් ලෙස හඳුන්වනු ලැබුයේ,
1. සලමීයේදි ය.
2. ලුස්ත්‍රාවේදී ය.
3. පර්ගාවේදීය
4. ඉකෝනියේදි ය.

33. දෙවන ධර්මදූත ගමනට පාවුල්තුමා සමඟ එක් වූයේ,
1. සීලස්. තිමෝතියස් හා ලූක්ය.
2. සීලස්, මාක් හා තිමෝතියස් ය.
3. මාක්, තිමෝතියස් හා බර්ණබස් ය.
4. මාක්, ලූක් හා බර්ණබස් ය.

34. පාවුල්තුමා පැමිණීමට පෙර එපීස නගරය ප්‍රසිද්ධව තිබුණේ,
1. ගස්ගල් වන්දනාවටය.
2. බහු දේව වන්දනාවටය.
3. දෙවියන් වහන්සේ නැමදීමටය.
4. යන්ත්‍ර මන්ත්‍ර අභ්‍යාස වලටය.

35. පාවුල්තුමා රෝමයට යාමේ අවස්ථාව උදාකර ගනිමින් අධිරාජ්‍යයාගේ විනිශ්චය ඉල්ලා සිටියේ,
1. හෙරොද් සහ පිලිප් රජුගෙන් ය.
2. පිලිප් සහ අග්‍රිපා රජුගෙන් ය.
3. පෙස්තුස් සහ අග්‍රිපා රජුගෙන්ය.
4. පෙස්තුස් සහ හෙරොද් රජුගෙන්ය.

36. කිතුණුවන් වන අප අන් අය ප්‍රතික්ෂේප කිරීම හා අන් මතවලට ගරු නොකරන පරිසරයක් නිර්මාණය කරගැනීමෙන්,
1. අසාධාරණයන්ට මුහුණදීම සිදුවේ.
2. සහජීවනයෙන් දිවි ගෙවීමට නොහැකිවේ.
3. වෙනත් ආගමිකයන් විසින් කොන් කරනු ලැබේ.
4. පාපයට පංගුකාරයන් නොවේ.

37. පාවුල්තුමා ගලාති ලිපියේ සඳහන් කර ඇති ආකාරයට ආත්මයාණන් වහන්සේගේ මඟ පෙන්වීම ඇතිව හැසිරෙනු ලබන අයවලුන්,
1. බුද්ධිමත්ව ජීවත් වෙයි.
2. පාපයෙන් මිදීම ලබයි.
3. මාංශික තෘෂ්ණාවලට වසඟ නොවේ.
4. ව්‍යසන හමුවේ ජයග්‍රහණය ලබයි.

38. දෙවියන් වහන්සේගේ ප්‍රේමය කිසිම තරාතිරමක් නොමැතිව මිනිසාට ලැබෙන බව පැහැදිලි වන්නේ,
1. "දෙවියන් වහන්සේ ලෝකයාට කොතරම් ප්‍රේම කළ සේක් ද"
2. ඔබත් එකිනකාට ප්‍රේම කරන්නා යන්න තුළින් ය.
3. ඔබත් පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කරන්න යන්න තුළින් ය.
4. "නිරන්තරයෙන් ප්‍රේමයෙහි පවතින්න" යන්න තුළින් ය.

39. යෙසායා දිවැසිවරයා, මෙන් දෙවිඳුන්ගෙන් පිවිතුරු ජීවිතයක් ලබන මිනිසා සෑම විටම,
1. ප්‍රේමය තුළ දිවි ගෙවයි.
2. අවධානමෙන් මිදෙයි.
3. දේව බලයෙන් සන්නද්ධ වෙයි.
4. සෑමවිටම සමාජයේ යහපත සඳහා ක්‍රියා කරයි.

40. වර්තමාන සමාජයේ අරබුද මැද ජීවත්වන කිතුණුවන් වන අපගේ යුතුකම විය යුත්තේ,
1. කිතුණු පවුල් සොයා බලා උදව් කිරීම.
2. සෑම විටම දේව වචනය සමාජයට දේශනා කිරීම.
3. සමාජය හෙළාදැක අඩුපාඩු වැරදි පෙන්වාදීම.
4. ඉවසීමෙන් කමාවෙමින් සෑම විටම දේව ගෞරවය සඳහා ක්‍රියා කිරීම.

## II කොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

i. කිතු උපත පිළිබඳ දිවැස් වැකි ප්‍රකාශ කළ දිවැසිවරුන් දෙදෙනෙකු නම් කරන්න.
ii. සෙකරියස් පූජකතුමා තුළ දක්නට ලැබුණා වූ ගුණාංග දෙකක් ලියන්න.
iii. කිතුණු සභාවන් තුළ පුද්ගලික හා සාමූහික ආගමික වාතාවරණයන් ශක්තිමත් කරන ආගමික පිළිවෙත් දෙකක් පෙන්වා දෙන්න.
iv. රූප විපර්යාසය සිදුවන අවස්ථාවේ දී ජේසුස් වහන්සේගේ දෙපස තේජශ්‍රීයෙන් වැඩ සිටි දෙදෙනා නම් කරන්න.
v. පෙන්තකොස්ත දිනයේ ශ්‍රාවකයන් අත්දුටු සිද්ධීන් දෙකක් සඳහන් කරන්න.
vi. සාවුල් වෙත ගොස් අත් තබන ලෙස අනනියස් ලද දර්ශනයෙන් ප්‍රකාශ වූ සාවුල්ගේ මෙහෙවර කෙබඳු දැයි ලියා දක්වන්න.
vii. ඇතැන්ස් නගරයේ දී පාවුල්තුමාට හමු වූ දාර්ශනිකයින් කණ්ඩායම් දෙක නම් කරන්න.
viii. දේව රාජ්‍යයේ වර්ධනය පිළිබඳ ඉගැන්වීම සඳහා යොදාගත් උපමා දෙකක් නම් කරන්න.
ix. a. දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති ප්‍රකාශ කළේ කවුරුන් විසින් ද?
b. දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති අපේක්ෂණ ප්‍රකාශයට පත් කිරීමට යොදාගත් ක්‍රමවේද අතරින් ප්‍රබලම මාධ්‍ය කුමක් ද?
x. පවුලක දරුවන් විසින් දෙමව්පියන් වෙනුවෙන් ඉටු කළ යුතු වගකීම් දෙකක් පෙන්වා දෙන්න. (ල:2x10=20)

(02) i. ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට සම්බන්ධ වූවන් දෙදෙනෙකු නම් කරන්න.
ii. ඔවුන්ගෙන් එක් අයෙකුගේ ප්‍රතිචාර ලියා දක්වන්න.
iii. ඉහත ප්‍රතිචාරය මඟින් කිතුණු දිවියට ගෙනෙන පණිවිඩ පිළිබඳ වාක්‍ය පහකින් ලියා දක්වන්න.
(ල:2+3+5=10)

(03) i. රූප විපර්යාසය සිදුවන අවස්ථාවේදී ජේසුස් වහන්සේ සමඟ සිටි ගෝලයන් දෙදෙනෙකු නම් කරන්න.
ii. එම අවස්ථාවේ දී දෙවියන් වහන්සේගේ හඬ මඟින් ප්‍රකාශ කළේ කුමක් ද?
iii. රූප විපර්යාසය අත්දැකීම තුළින් ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගන්නා අපගේ ජීවිත තුළින් ආදර්ශනය විය යුතු ගුණාංග පහක් ලියන්න. (ල:2+3+5=10)

(04) i. ලෞකික රාජ්‍යයක් තුළ දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න.
ii. දේව රාජ්‍ය තුළ දැකිය හැකි ලක්ෂණ තුනක් ලියන්න.
iii. දේව රාජ්‍යයේ වර්ධනය සඳහා කිතුණු දරුවන් වන ඔබට කළ හැකි දේවල් පහක් කෙටියෙන් විස්තර කරන්න.
(ල:2+3+5=10)

(05) i. සඳහටම පවතින ශ්‍රේෂ්ඨතම ධර්මතාවය කුමක් ද?
ii. කොරින්ති 13 ට අනුව පාවුල්තුමා පෙන්වා දී ඇති ප්‍රේමයේ ගුණාංග හයක් ලියන්න.
iii. කිතුණු දරුවකු වන ඔබට වර්තමාන සමාජයේ ප්‍රේමයෙන් යුතුව ක්‍රියා කළ හැකි අවස්ථා පහක් කෙටියෙන් විස්තර කරන්න. (ල:2+3+5=10)

(06) i. සාමාන්‍ය ජන ජීවිතය තුළ දරිද්‍රතාවය ඇති වීමට බලපාන හේතු දෙකක් ලියන්න.
ii. ලෞකික දිළිඳු බව පිටුදැකීමට ක්‍රියා කළ යුතු ආකාර තුනක් කෙටියෙන් විස්තර කරන්න.
iii. ආධ්‍යාත්මික දිළිඳු බව පිටුදැකීමට ජේසුස් වහන්සේ කළ ඉගැන්වීම් වලින් ලබාගත හැකි ආදර්ශ පහක් කෙටියෙන් විස්තර කරන්න. (ල:2+3+5=10)

(07) පහත මාතෘකා අතරින් දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. **ශුද්ධ වූ පාවුල්තුමා**
- ජීවිත පසුබිම
- හිත් හැරීම සිදු වූ අයුරු
- හවුල් නායක්වයට කැඳවනු ලැබූවන්
- හවුල් නායකත්වය තුළ දේශනා කිරීමෙන් ලද යහපත් ප්‍රතිඵල
- පාවුල්තුමාගෙන් ඔබගේ ජීවිතයට ගතහැකි ආදර්ශ

(5) WWW.PastPapers.WiKi (4)



Download Term Test Papers, Short Notes From One Place!

7.8

ii. **ආගන්තුක සත්කාර**

- ආගන්තුක සත්කාරයේ වැදගත්කම
- ජුදා සමාජය ආගන්තුක සත්කාරය දැක්වූ අවස්ථාව
- බයිබලිය උදාහරණ
- ශ්‍රී ලංකා සමාජයේ ආගන්තුක සත්කාරය
- කිතුණු දිවියේ ආගන්තුක සත්කාරය දැක්වීමේ වැදගත්කම

iii. **යාච්ඤාව**

- යාච්ඤාව යනු හැඳින්වීම
- යාච්ඤාවේ වැදගත්කම
- ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථාව
- අප යාච්ඤා කරන අවස්ථාව
- කිතුණු ජීවිතයට යාච්ඤාවේ වැදගත්කම

iv. **කමාව අත් දකිමු**

- කමාව දීම පිළිබඳ අප ඉගෙන ගන්නා චරිත දෙකක්
- ස්වාමීන් වහන්සේගේ යාච්ඤාවේ කමාව පිළිබඳ වැදගත් වී ඇති වදන්
- කමාවදීම පිළිබඳ ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්
- ජේසුස් වහන්සේ කමාව දුන් අවස්ථාවක්
- කමාවදීම ඔබට වැදගත් වන ආකාරය (ල:5+5=10)